## ග්‍රාමීය ආර්ථික සංවර්ධන ආයෝජන වලින් අවම වශයෙන් 25%ක් වත් කාන්තාවන් සඳහා යෙදවීම

## ප්‍රගතිය - 2017

ග්‍රාමීය ආර්ථික සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වන ව්‍යාපෘති ආයෝජනයන්ගෙන් අවම වශයෙන් 25% ක් කාන්තාවන් උදෙසා යෙදවීම යන මැයෙන් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් 2015.12.18 දිනෙන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අංක 15/1983/740/005 හා 2016.03.09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත. එම අනුමැතිය ප්‍රකාර ව සියලු ම අමාත්‍යාංශ, පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කල ආකාරය දැනුවත් කරමින් අප විසින් 07/2016 දරණ චක්‍රලේඛය යොමු කරන ලදි.

ඒ අනුව, මේ දක්වා මෙම තීරණය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියට අදාළ ව ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ ඇති ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, උතුරු මැද පළාත් සභාව හා සබරගමු පළාත් සභාව විසින් දත්ත හා තොරතුරු ඇතුළත් ප්‍රගතිය අප වෙත ඉදිරිපත් කර ඇත.